# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2050/2 – 2017 දෙසැම්බර් 18 වැනි සඳුදා – 2017.12.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 1888/9 හා 2014.11.11 වැනි දින දරන අති *විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද, 2014 අංක 327 හා 2014.11.10 වැනි දින දරන ආඥාවේ සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. එනමුත් මේ කියන ලද මෙහි පහත විස්තර වන ඉඩම් කොටසේ භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාරගෙන නැත. එ බැවින්, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (1) වැනි වගන්තිය යටතේ මාහට පැවරී ඇති බලතල අනුව අංක 1888/9 හා 2014.11.11 වැනි දින දරන අති *විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 2014 අංක 327 හා 2014.11.10 වැනි දින දරන ආඥාවට අයත් පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස මෙම නියමය මඟින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/8/2014/පීසී/135.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: පීටීබී/එල්එන්ඩී/ඒසීකිව්විඅයි/07/32.
2017 දෙසැම්බර් මස 15 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරවක් කෝරළේ සුළු කොට්ඨාසයේ වැලිව (අ.ග.පි. 10) ගමේ පිහිටි මාතර දිස්ත්‍රික් සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එම්ආර්/පීටීබී/2014/349 හා 2014.10.15 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර ''ඒ'' ලෙස පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.5130ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

01. **කැබලි අක්ෂර 'ඒ' – උළුගොඩගෙදරවත්ත හෙවත් උඩහගෙදරවත්ත– ප්‍රමාණය: හෙක්. 0.5130**

උතුරට: ගොරකගහ පිට්ටනිය හෙවත් පරණගෙදරවත්ත සහ මාර්ගය; නැගෙනහිරට: මාර්ගය සහ මාර්ගය (මා.සං.අ.); දකුණට: මාර්ගය (මා.සං.අ.), මාර්ගය සහ ළිඳගාවකුඹුර; බටහිරට: මාර්ගය, ළිඳගාවකුඹුර සහ ගොරකගහ පිට්ටනිය හෙවත් පරණගෙදරවත්ත.

01 - 01